# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1789/13 - 2012 දෙසැම්බර් මස 17 වැනි සඳුදා - 2012.12.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**මත්පැන් හා විනාකිරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි වූ උපලේඛණයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට මත්පැන් හා විනාකිරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දැක්වෙන විරෝධතා 2013 ජනවාරි මස 09 වැනි දින දහවල් 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, එම විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක්ද ඊට අඩංගු විය යුතු ය.

වී. බී. පී. කේ. වීරසිංහ,<br>
සභාපති,<br>
මත්පැන් හා විනාකිරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2012 ඔක්තෝබර් මස 30 වැනි දින,<br>
කොළඹ 05,<br>
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

මත්පැන් හා විනාකිරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, 1946 මැයි මස 24 වැනි දින අංක 9560 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබුවා වූ නිවේදනයෙහි වූ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කල වෙනස් කරන ලද්දාවූ ද අවසන් වරට 2010.06.30 වැනි දින අංක 1660/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය මගින් වෙනස් කරනු ලැබූ තීරණ එම උපලේඛනයෙහි II හා III කොටස් වෙනුවට පහත සඳහන් කොටස් ආදේශ කිරීමෙන් වෙනස් කළ යුතු ය.

*II වැනි කොටස*

මත්පැන් හා විනාකිරි කර්මාන්තයේ ඇතැම් කාර්යයනට අදාල වන්නා වූ කෑලි මිම්මේ වැඩට ගෙවිය යුතු අවම වේතන ඃ

| *කාර්යය හා ප්‍රමාණය* | *රු. ශත* |
|---|---|
| පොල් ගස් ඇදීම "එක් ඇඳුත්තකට" | 52.25 |
| කඹ මාරු කිරීම "එක් ඇඳුත්තකට" | 25.25 |
| කඹ කපා අස් කිරීම "එක් ඇඳුත්තකට" | 22.00 |
| පොල් ගස් හැර ඇරීම "ගස් 110කට වැඩි නොවන අතුරකට" | 2,625.00 |
| තැබෑරුම් වලට රා සැපයීම පිණිස පොල්, කිතුල් හෝ තල් ගස් මැදීමට | |
| ගාලු දිස්ත්‍රික්කයේ කම්කරුවකු ගෙනැවිත් දෙන රා ගැලුමකට | 40.50 |
| බස්නාහිර පළාතේ කම්කරුවකු ගෙනැවිත් දෙන රා ගැලුමකට | 86.00 |
| හලාවත දිස්ත්‍රික්කයේ කම්කරුවකු ගෙනැවිත් දෙන රා ගැලුමකට | 81.00 |
| නුවරඑළිය හෝ මහනුවර දිස්ත්‍රික්කයේ කම්කරුවෙකු ගෙනැවිත් දෙන රා ගැලුමකට | 90.00 |
| මාතර, යාපනේ හෝ මාතලේ දිස්ත්‍රික්කයේ කම්කරුවෙකු ගෙනැවිත් දෙන රා ගැලුමකට | 81.00 |
| පුත්තලම, අනුරාධපුර, කුරුණෑගල හෝ හම්බන්තොට දිස්ත්‍රික්කයේ කම්කරුවකු ගෙනැවිත් දෙන රා ගැලුමකට | 86.00 |
| බදුල්ල හෝ රත්නපුර දිස්ත්‍රික්කයේ කම්කරුවෙකු ගෙනැවිත් දෙන රා ගැලුමකට | 90.00 |
| මඩකලපුව හෝ මන්නාරම දිස්ත්‍රික්කයේ කම්කරුවෙකු ගෙනැවිත් දෙන රා ගැලුමකට | 90.00 |
| කෑගලු දිස්ත්‍රික්කයේ කම්කරුවෙකු ගෙනැවිත් දෙන රා ගැලුමකට | 60.00 |
| ත්‍රිකුණාමලය හෝ මුලතිව් දිස්ත්‍රික්කයේ කම්කරුවෙකු ගෙනැවිත් දෙන රා ගැලුමකට | 78.00 |
| ස්කාගාරයට හෝ විනාකිරි සෑදීමට රා සැපයීම පිණිස පොල්, කිතුල් හෝ තල්ගස් මැදීමේ කම්කරුවකු ගෙනැවිත් දෙන රා ගැලුමකට | 18.50 |
| ස්කාගාරයට හෝ විනාකිරි සෑදීමට රා සැපයීම පිණිස මල් තැලීමට පොල්, කිතුල් හෝ තල්ගස් 100කට වැඩි නොවූ විට | 2,400.00 |
| 100ට වැඩි එබඳු සෑම ගසකටම | 25.25 |
| තැබෑරුම් වල රා සැපයීම පිනිස මල් තැලීම - පොල්, කිතුල් හෝ තල්ගස් 25-40 දක්වා | 2,290.00 |

කම්කරුවකු අරක්කු කර්මාන්තය සඳහා හෝ විනාකිරි සෑදීමේ කර්මාන්තය සඳහා හෝ රා මැදීමට යොදවා ගන්නා සෑම විටකම ඔහු විසින් ගෙනැවිත් දෙන රා වල඿ සන ප්‍රමාණයෙන් 7.5%ක මධ්‍යසාර ප්‍රමාණයක් තිබිය යුතුය යන කොන්දේසියට යටත්ව පොල්, කිතුල් හෝ තල්ගස් මැදීම පිළිබඳ පූර්වෝක්ත වේතන ප්‍රමාණය ඔහුට ගෙවිය යුතුය. එසේ වුවත්, එකී රා වල ඝන ප්‍රමාණයෙන් 7.5%කට අඩු මධ්‍යසාර ප්‍රමාණයක් තිබේ නම්, ඉහත කී වේතනයට අනුපාතිකව ඔහුට ගෙවිය යුතුය.

*III වැනි කොටස*

මෙහි පහත I තීරයේ නිශ්චිතව දැක්වෙන කම්කරුවන්ට කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අවම පඩි ප්‍රමාණය II වැනි තීරයේ දැක්වෙන අනුරූප පඩි ප්‍රමාණයක් විය යුතුය.

යම් මාසයකදී කම්කරුවකු අවසර නොමැතිව දින 4කට වැඩියෙන් නොපැමිණි විට, අනුමත නිවාඩු දින 4 ඉක්මවන දින ගණනට, ඔහුගේ මාසික වැටුපෙන් අනුපාතික ප්‍රමාණය අඩුකර ඉතිරි වැටුප ගෙවිය යුතුය.

| *I වැනි තීරය*<br>*කම්කරු පන්තිය*<br>*පහත දැක්වෙන සේවයේ නියුක්ත වූවන්ට* | *II තීරය*<br>*ප්‍රමාණය මසකට*<br>*රු. ශත* |
|---|---|
| අතුරු කංකානමගේ වැඩ | 11,420.00 |
| රා තැබෑරුමේ කාවල්කාර වැඩ | 9,720.00 |
| අරක්කු තැබෑරුම් කාවල්කාර වැඩ | 9,720.00 |
| අතුරු කාවල්කාර වැඩ | 9,315.00 |
| එකතු කිරීමේ ස්ථානයේ කළමනාකාර වැඩ | 10,450.00 |
| තැබෑරුම් වල රා විකිණීමේ වැඩ | 10,285.00 |
| තැබෑරුම් වල අරක්කු විකිණීමේ වැඩ | 10,285.00 |

| *I වැනි තීරය*<br>*කම්කරු පන්තිය*<br>*පහත දැක්වෙන සේවයේ නියුක්ත වූවන්ට* | *II තීරය*<br>*ප්‍රමාණය මසකට*<br>*රු. ශත* |
|---|---|
| ව්‍යාපාරීය අංශයේ (රා ගෙනයාම, රා පීප්ප පැටවීම හා බෑම, ලේහර බාල්දි ටින් හා වෙනත් භාජන සේදීමේ වැඩද ඇතුළුව) පොල්, කිතුල් හෝ තල් ගස් වලින් රා එකතු කිරීම | 10,450.00 |
| ව්‍යාපාර විනාකිරි අංශයේ (ගෙනයාමේ වැඩත් ඇතුළුව) පොල්, කිතුල් හෝ තල් ගස් වලින් රා එකතු කිරීම | 9,400.00 |
| ස්කාගාරයේදී රා පෙරීම | 9,770.00 |
| අරක්කු බෝතල් කිරීම, ඇබ ගැසීම හා ලේබල් ඇලවීම | 9,315.00 |
| දර කැපීම හා පැලීම, ස්කාගාරවලදී පීප්ප, බාල්දි හා වෙනත් භාජන ශුද්ධ කිරීම හා සේදීම, අරක්කු ගෙනයාම, පැටවීම, බෑම, අරක්කු මැනීම, රා බෝතල් කිරීම හා ඇබ ගැසීම, විනාකිරි සෑදීම, විනාකිරි බෝතල් කිරීම, ඇබ ගැසීම හා ලේබල් කිරීම, බෙදාහැරීම පිණිස විනාකිරි ගෙනයාම | 9,315.00 |
| ව්‍යාපාරික අරක්කු අංශයේ (ගෙනයාමේ වැඩත් ඇතුලුව) පොල්, කිතුල් හෝ තල් ගස්වලින් රා එකතු කිරීම | |
| 80 නොවැඩි ගස් ගණනක් සඳහා | 9,640.00 |
| 81ට නොඅඩු හා 90ට වැඩි නොවන ගස් ගණනක් සඳහා | 9,775.00 |
| 91ට නොඅඩු හා 100ට වැඩි නොවන ගස් ගණනක් සඳහා | 9,910.00 |
| 101ට නොඅඩු 110ට වැඩි නොවන ගස් ගණනක් සඳහා | 10,045.00 |
| 111ට නොඅඩු හා 120ට වැඩි නොවන ගස් ගණනක් සඳහා | 10,180.00 |
| 121ට නොඅඩු හා 130ට වැඩි නොවන ගස් ගණනක් සඳහා | 10,315.00 |
| 131ට නොඅඩු ගස් ගණනක් සඳහා | 10,450.00 |

01-41

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.